## 2022 O/L - සතර කන් මන්ත්‍රණය විචාර අංක 01

**1. මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය කෞශල්‍යය හේතුවෙන් වේදේහ රාජ්‍යය ආරක්ෂා වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)**

හෙළ බොදු බැතිමතුන්ගේ අතිශය ජනාදරයට පත් පන්සිය පනස් ජාතක පොතෙහි එන දීර්ඝතම ජාතකය උම්මග්ග ජාතකයයි. ස්ථිර කතුවරයෙකු නොමැති වුවත් කතුවරුන් කිහිප දෙනෙකුගේම දායකත්වයෙන් ලියැවුනු බව පිලිගැනෙන ජාතක පොත් වහන්සේ හතරවන පරාක්‍රමබාහු රජ දවස වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයාගේ අනුග්‍රහයෙන් පාලි ජාතකට්ඨ කතාව ඇසුරෙන් සකස් වූවකි. අපණ්ණක ජාතකයෙන් පටන් ගෙන වෙස්සන්තර ජාතකයෙන් අවසන් වන මෙහි අන්තර්ගත මා හැගි ජාතක කතා ගණන 547 කි.

උත්තර පඤ්චාල නුවර චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවනට කේවට්ට නම් බමුණු කෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරයි. එකල මියුලු නුවර වේදේහ රජුගේ අනුශාසකයා වූයේ මහෞෂධ පණ්ඩිතයෝ ය. කේවට්ටයාගේ රහස් මන්ත්‍රණය මහෞෂධ පඩිතුමාට දැන ගත හැකි වන්නේ ඔහු විසින් චර පුරුෂ සේවාවේ යොදවා තිබුණු ගිරා පෝතකයා අතිනි.

**සාල්ලෙක ලාලා පාතට බාන කෙනකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඩක් හෙලා, කිමෙක් දැයි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවැත වර්චස් පිඩක් හෙලා,**

ගිරා පෝතකයා රහස් මන්ත්‍රණය අසා සිට කේවට්ටයා හිස වර්චස් පිඩක් හෙලා පලා යන ආකාරය කතුවරයා ඉදිරිපත් කරන්නේ පාඨකයාට හාස්‍ය රසයක්ද එක් කරමිනි. මෙලෙස මහෞෂධ පඩිතුමාගේ නුවණ නිසා ගිරා පෝතකයෙකු චර පුරුෂ සේවාවේ යොදවා ගැනීමෙන් මියුලු නුවරට අත්විඳින්නට සිදු වන අනතුර කල් තියා දැන ගන්නට අවස්ථාව උදා වෙයි.

උපායශීලී උපක්‍රම වලින් සියලු නුවර අල්ලා ගන්නා කේවට්ටයා ඇතුළු එක් සියයක් රජ දරුවන් අටළොස් අක්ෂෞහණියක් සේනාවෙන් යුක්ත ව මියලු නුවර වට කොට සිටින වේලේ වේදේහ රජු ඇතුළු මියුලු නුවර වැසියන් බියෙන් තැති ගනියි. එවේලේ රජ්ජුරුවන් අස්වසාලීමට මහෞෂධ පඩිතුමා ක්‍රියා කරන ආකාරය පැසසුම් සහගතය. කතුවරයා එය උපමා වලින් ගෙන හැර දක්වන්නේ මෙසේය.

**රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දන්නා වෙදකු පිළිසරණ වන්නා සේ ද, සා දුකින් පෙළෙන එකකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේ ද, පිපාසා ඇති එකකුට පැන් පුව හොත් මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නා සේ ද, ...**

තම උපාය කෞශල්‍යය පිළිබඳව දන්නා රජු මෙන්ම නුවර වැසියන් මානසික පීඩාවෙන් මුදවාගැනීමට මහෞෂධ පඩිතුමා පළමුව ක්‍රියා කරයි. නුවර වැසියන් ලවා මහත් උත්සවයක් සූදානම් කරවන ඔහු මියුලු නුවර ආරක්ෂා කිරීමේ වගකීම තම භාරයට ගනියි. කේවට්ටයා නොයෙකුත් උපාය යොදවා මියුලු නුවර අල්ලා ගැනීමට උත්සහ කළත් ඒ සියලූ උපාය මහෞෂධ පඩිතුමාගේ නුවණ හමුවේ ව්‍යර්ත වී යයි.

**කීප දවසක් පැන් නවතා ලන්නා පැන් නොලදින් ක්ලාන්ත වූවාහු දොර ඇර පියන්නාහ. වී සාල් වැද්ද නො දෙම්හ. බතින් පීඩිත වූ මනුෂ්‍යයෝ දොර හැර පියන්නාහ. දර නවතා ලා නුවර ඇර ගනුම්හ යි කීයේ ය.**

පැන් නැවැත්වූ කල මහත් වූ පැන් ප්‍රමාණයක් නුවර ඇති බව පෙන්වයි. සාල් නැවැත්වූ කල මහත් වූ සාල් ප්‍රමාණයක් නුවර ඇති බව පෙන්වයි. දර නැවැත්වූ කල මහත් වූ දර ප්‍රමාණයක් නුවර ඇති බව පෙන්වයි. මෙලෙස මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය කෞශල්‍යය හේතුවෙන් වේදේහ රාජ්‍යය ආරක්ෂා වූ ආකරය ජාතකය පුරාම නිරූපණය වී ඇත්තේය.

හසිත හෙට්ටිආරච්චි
071-9020298